# එකමුතු අපි පුංචි යාළු



තිනුලි තෙනුලිකා මනම්පේරි

# එකමුතු අපි පුංචි යාළු

**තිනුලි තෙනුලිකා මනම්පේරි**

ප්‍රථම මුද්‍රණය : 2023

කතෘ : තිනුලි තෙනුලිකා මනම්පේරි

ලිපිනය : 290 B, දියපලාගොඩ,
මුරුතලාව,
මහනුවර.

ISBN අංකය : 978-624-206-833-6

මුද්‍රණය
“PRESS”
නො: 24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

*නිතර අපහට හමුවන අපගේ ජීවය වන ගහ කොළ, වනාන්තර ආදි හා*

*එහි වෙසෙන සියලු ම සතුන්ට ද, පරිසරයට ද,*

*ආදරය, කරුණාව දැක්වීමට මා හට හුරු කළ*

*මාගේ ආදරණීය දෙමාපියන්ටත්,*

*ග්‍රන්ථ නිර්මාණකරණයට හා ලිවීමට, කියවීමට පමණක් නොව,*

*සමාජයේ කැපී පෙනෙන මහාමායා සිසු දැරියක් නිර්මාණය කිරීමට*

*නිතරම උත්සහ දරණ සහ එයට කැපවීමෙන් වැඩ කරන*

*මාගේ ආදරණීය ගුරු මෑණියන් වන සමන්මලී ගුරු මෑණියන්ටත්*

*මෙම පොත ඉතා ආදරයෙන් පුද කරමි...*

✳ ✳ ✳

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන ''විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර


විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023-01-01


# ස්තූතිය

පොත ලිවීමට මා හට උදව් උපකාර කළ හා මා දිරිගැන්වූ දෙමාපියන්, මාගේ අත්තම්මා, ගුරු මණ්ඩලය හා සහෝදරයන් ඇතුළු උපකාර කළ සියලු දෙනාටම ස්තූතිය පුද කරමි.




කැලේ සත්තු හරි සමගියි. කරදරයක් වුණා ම හැමෝ ම එකට එකතු වෙනවා. එදත් එහෙම දවසක්. එදා උදේ ඉඳලා මහ සද්දෙන් සත්තු කෑගහනවා.

වලි කුකුළෝ දෙන්නා උන්ගේ පැටව් දෙන්නත් එක්ක ගහක් උඩට වෙලා කුක්කු කූ...... කූ...... කිය කියා බෙරිහන් දෙනවා.ඒ ඇයිද දන්නව ද? හා අම්මයි හා තාත්තයි කෑ ගහ ගහා පැටව් දෙන්නෙක් හොයනවා.




ඒ ගොල්ලන්ගෙ පැටව් හතර දෙනාගෙන් දෙන්නෙක් නැතිවෙලා. හා අම්මා අඬන තරම් බලාගෙන ඉන්ට බෑ. හා තාත්තයි අනික් පැටව් දෙන්නයි කෑ ගහනවා එයාලව හොයලා දෙන්න කියලා.


මේ ගොල්ලො කෑ ගහ ගහා අඬ අඬ කැලේ පොකුණ ළඟට ම ගියා. පොකුණේ හිටපු තාරා අම්මලයි තාරා තාත්තලයි ඒ ගොල්ලන්ගෙ දරුවොත් එක්ක පීනාගෙන පොකුණේ ඉවුරට ම ආවා.



හා තාත්තගෙන් කතාව අහගත්තු එයාලා හරිම දුකින් එයාලගෙ පැටව් ටිකත් තුරුළු කරගෙන දුක් වුණා.




ඔය අතරේ කපටි නරි නයිදෙත් එයාගෙ නරි හාමිනෙත් එක්ක එයාගේ පැටව් දෙන්නෙකුත් හොරෙන් බලා මොනවාද කතා වෙවී ඉන්නවා. මේ සද්දෙට කැලේ හැමෝම එකතු වුණා.



වලස් පවුලකුත් එතනට ඇවිත් දුක් වුණේ එයාලගෙ දරුවොත් එක්ක. වලස් තාත්තා නම් කීවේ මේ අවනඩුව කැලේ රජා වුණ සිංහ රජාට පැමිණිලි කරමු කියලා.


ඔන්න වලස් තාත්තා ගිහින් සිංහ රජතුමා එක්ක ආවා. ගස් අතුවල මයිනො, ගිරවු, තව කුරුල්ලෝ පිරිලා කෑ ගහ ගහා බලා ඉන්නවා.

ඔන්න සිංහ රජතුමා අර කුරුල්ලෝ රංචුවට
නියෝග කළා හැම තැනම ඉඟිලිලා හා පැටව්
හොයන්න උදව් කරන්ට කියලා.



ඔන්න මේ කුරුල්ලො ඉඟිලෙන කොට දැක්කා අර කපටි නරි නයිදෙ ගලක අස්සෙ හංගාගෙන ඉන්න අර හා පැටව් දෙන්නා. අර කපටි නරියා එයාලා දෙන්නා අරන් ගිහින් අර නරි දරුවො දෙන්නෙක් එක්ක එයාලා හංගලා මොකුත් නොදන්නවා වගේ මෙතනත් බලා ඉන්නවා. පස්සේ කුරුල්ලෝ ටික ඇවිත් සිංහ රජතුමාට මේ කතාව කිවුවා.





සිංහ රජතුමාට තරහා ගිහින් නරියට නියෝග කළා වහාම හා පැටවු දෙන්න ගෙනත් දෙන්ට කියලා.



දැන් හා අම්මටයි පැටවු දෙන්නටයි හා තාත්තාටයි හරි සතුටුයි එයාලගේ පැටව් ආයේ ලැබුණාට. නරියා කපටි වුණාට කැලේ සත්තු හැමෝම එකා වගේ සමඟියෙන් වැඩ කළ නිසා තමයි ඉක්මනට හා පැටවු දෙන්නා හොයා ගත්තෙ.



ඒක තමයි සමගිය කියන්නෙ. සමගියේ බලය ඒකනේ. අපිත් සමගියෙන් වැඩ කරමු නේද යාළුවනේ. උදව් ඕන වෙලා ඉන්න කෙනෙකුට උදව් දෙන්න පුරුදු වෙමු නේද යාළුවනේ.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023-11-01